## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2016 ජූලි මස 18 වන දින (සඳුදා) පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා , විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-07-05 වන දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/ VI (1) /16/ 53)

(අ). බස්නාහිර පළාතේ පළාත් සභා පාලනය යටතේ වන පාසල් වල සිටින මුළු ගුරු සංඛ්‍යාව කොපමණද?

(ආ). එම සංඛ්‍යාව ගුරු වර්ග අනුව වර්ගීකරණයේදී කොපමණ සංඛ්‍යාව බැගින් සිටීද?

(ඇ). දැනට පවතින චක්‍රලේඛන ප්‍රතිපාදන අනුව පළාතේ සිටිය යුතු මුළු ගුරු සංඛ්‍යාවත් එම සංඛ්‍යාව ගුරු වර්ග අනුව කොපමණ බැගින්ද යන්නත් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඈ). 2014 පැවැත් වූ බස්නාහිර පළාත් ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වූ තරඟ විභාගයෙන් සමත්ව,මෙතෙක් ගුරු පත්වීම් නොලද සංඛ්‍යාව කොපමණද?

(ඉ). මෙකී විභාගය සමත් එම සංඛ්‍යාවට ගුරු පත්වීම් ලබාදෙන්නේ කවදාද?

(ඊ). මෙතෙක් එම විභාගය සමත් අයට ගුරු පත්වීම් ලබානොදීමට හේතුවී තිබෙන බාධාව/බාධාවන් මොනවාද?

2. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-07-05 වන දින අසන ලද ප්‍රශ්නය: ( ප්‍ර/vi(1)/16/55 )

(අ). ඔබතුමා විසින් මේ වනවිට බණ්ඩාරගම කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල බලප්‍රදේශයට අයත් පාසලින් පාසලට සාමාන්‍ය පෙළ හා උසස් පෙළ ප්‍රතිඵල පිළිබඳව විශ්ලේෂණයක් කර තිබේ ද?

(ආ). එම කොට්ඨාශයේම 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සාමාන්‍ය පෙළ පන්ති සහ උසස් පෙළ පන්ති පාදක කරගෙන විෂයයන් අනුව වෙන් වෙන් වශයෙන් සහ පාසලෙන් පාසලට ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණ වාර්තාවක් සභාගත කරන්නේ ද?

(ඇ). එම විශ්ලේෂණ වාර්තාව මගින් ලබා දී ඇති සංඛ්‍යා ලේඛන අනුව කොට්ඨාශය තුළ අධ්‍යාපනයෙහි ගුණාත්මක වර්ධනය පිළිබඳව ඔබතුමා සෑහීමකට පත් වන්නේ ද?

(ඈ). බණ්ඩාරගම අධ්‍යාපන කොට්ඨාශයේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා මේ වන විට ඔබතුමා විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවා ද?

3. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: ( ප්‍ර/vi(1)/16/56 )

අ) අංක 129 වත්තේගෙදර පාර, මහරගම ලිපිනයේ සී/ස 532/C වත්තේගෙදර සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිතියේ මූල්‍ය වංචාවක් සිදු වී ඇති බව දන්නේද? එසේනම් කුමන ආකාරයේ මූල්‍ය වංචාවක්ද? කොපමණ මුදලක්ද?

ආ) මෙම සමිතිය සමූපකාර පනත යටතේ මුදල් තැන්පතු භාර ගැනීම සඳහා ලියාපදිංචි වී ඇත්නම් අදාළ ලියාපදිංචි සහතිකයේ සහතික පිටපතක් සභාගත කරන්නේද?

ඇ) ඉහත සමිතියේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වර්ෂ 2013,2014,2015 සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත්ද? එහිදී ඉහත වංචාව අනාවරණය වී ඇත්ද? එම විගණන වාර්තාව සභාගත කරන්නේද? නොඑසේ නම් මන්ද?

ඈ) තැන්පත්කරුවන්ගේ මුදල් වෙනත් බැංකුවක ආයෝජනය කර තිබුණේද? එසේ නම් කුමන ආකාරයෙන් කිනම් ස්ථානයකද? නැතිනම් එම මුදල් සම්බන්ධයෙන් ගෙන තිබු ක්‍රියාමාර්ග කවරේද?

ඉ) 2013,2014,2015,2016 වර්ෂ වල අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් වී ඇත්ද? නම් සහ ලිපිනයන් සමඟ එම අයවලුන් කවුරුන්ද?

ඊ) ඉහත අධ්‍යක්ෂක මණ්ඩල පත්ව ඇති ආකාරය පිළිබඳව ලේඛන මත කරුණු ඉදිරිපත් කළ හැකිද? එසේනම් එම ලේඛන මොනවාද?

උ) මෙම වංචාවන්ට සම්බන්ධ අයවළුන් හඳුනාගෙන තිබේද? නම් සහ තනතුරු වශයෙන් ඒ කවුරුන්ද? එම අය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

**4.** **ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:** **( ප්‍ර/vi(1)/16/57 )**

අ) බස්නාහිර පළාතේ එක් එක් මැතිවරණ කොට්ඨාශ තුල වර්ෂ 2009/01/01 දින වන විට සක්‍රියව පැවති

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද?

ආ) පිළිවෙලින් වර්ෂ 2009 සිට ඉදිරියට මේ දක්වා වාර්ෂිකව අළුතින් ආරම්භ කරන ලද;

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද?

ඇ) පිළිවෙලින් 2009 සිට ඉදිරියට මේ දක්වා වාර්ෂිකව වසා දැමූ;

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද?

ඈ) පිළිවෙලින් වර්ෂ 2009 සිට ඉදිරියට මේ දක්වා පාඩු ලබමින් පවත්වාගෙන යන;

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද? වාර්ෂික පාඩුව කීයද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද? වාර්ෂික පාඩුව කීයද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද? වාර්ෂික පාඩුව කීයද?

**5.** **ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:** **( ප්‍ර/vi(1)/16/58 )**

(අ) හෝමාගම මීගොඩ ළමා හා මාතෘ සායනයේ අයිතිය කිනම් ආයතනයක් හෝ පුද්ගලයකු සතුද යන්න මෙම පළාත් සභාව වෙත පැහැදිලි කල හැකිද?

(ආ) මෙම සායනයෙන් සේවා ලබා ගැනීම සඳහා මීගොඩ උතුර, මීගොඩ දකුණ, වටරැක උතුර, පානලුව යන කොට්ඨාශ වලින් විශාල ජනතාවක් පැමිණෙන බව ඔබතුමා දන්නේද?

(ඇ) මෙම සායනය පවත්වාගෙන යන ගොඩනැගිල්ල ඉතා අබලන් තත්ත්වයේ පවතින බැව් ද එහි ඉඩ පහසුකම් ප්‍රමාණවත්ව නොමැති බවද ඔබතුමා දන්නේද?

(ඈ) මෙම ගොඩනැගිල්ල අවසන් වතාවට සංවර්ධනය කරන ලද්දේ කිනම් වර්ෂයකදීද?

(ඉ) මීගොඩ ළමා හා මාතෘ සායනයේ ඇති අඩුපාඩු අවමකර මහජනතාවට පහසුවෙන් සේවා ලබා ගැනීමට හැකි පරිදි අවශ්‍ය කටයුතු සැලැස්වීම සම්බන්ධව ඔබතුමා විශේෂ මැදිහත් වීමක් කරන්නේද?

6. ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින්, ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: ( ප්‍ර/vi(1)/16/59 )

අ) බස්නාහිර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට, කොළඹ දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට, ගම්පහ දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට සහ කළුතර දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට 2014 , 2015 වර්ෂ තුල හා 2016 ජූනි 30දක්වා කාලය තුළදී මිළදී ගත් කාර්යාල උපකරණ වල මුළු වටිනාකම කීයද?

ආ) ඒ ඒ වසරට වෙන් වෙන් වශයෙන් එකී ස්ථාන සඳහා මිලදී ගත් භාණ්ඩ මොනවාද?

ඇ) පාවිච්චියට ගත්, අළුතෙන් කල මිලදී ගැනීම් නිසා ඒ ඒ වසරට වෙන් වෙන් වශයෙන් එකී ස්ථාන වලින් භාවිතයෙන් ඉවත් කල උපකරණ මොනවාද?

ඈ) ඒ ඒ කාර්යාල පරිශ්‍රයන් සඳහා උක්ත වර්ෂ වලදී අළුත් ඉදිකිරීම් හෝ භාණ්ඩ සැකසීම් හෝ වෙනත්, කල වියදම් තිබේද?

ඉ) එකී වියදම් සඳහා හේතු වූ අවශ්‍යතා කවරේද?

7. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: ( ප්‍ර/vi(1)/16/60 )

(අ)

i) 2014 වසරේදී බස්නාහිර පළාත් සභාව මඟින් ගුරු පුරප්පාඩු සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා විභාගය පැවැත්වූයේද?
ii) ඒ කුමන විෂයන් සඳහාද? කවදාද?
iii) ඒ ඒ විෂයන් සඳහා කොපමණ ප්‍රමාණයක් පුරප්පාඩු තිබුණාද?

(ආ)

i) පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල මත ගුරුවරු බඳවා ගනු ලැබූවේද?
ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද?
iii) ඒ ප්‍රමාණයන් විෂයන් වශයෙන් සඳහන් කරන්නේද?

(ඇ)

i) තවමත් ගුරු පුරප්පාඩු තිබේද?
ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද? ඒ කුමන විෂයන් සඳහාද?
iii) දිස්ත්‍රික් මට්ටමින් ඒ කොපමණද?

(ඈ)

i) මෙම පුරප්පාඩු පිරවීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?
ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද?

8. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/vi(1)/16/61)

(අ) සිසුන් 1300 පමණ අධ්‍යාපනය හදාරන බ/ප/මීග/ බෝලවලාන නිමල මරියා මහා විද්‍යාලයේ දැනටමත් ගොඩනැගිල්ලක් භාවිතයට නුසුදුසු හෙයින් ඉවත් කර ඇති බව ඔබතුමා දන්නේද?

(ආ) එම නිසා නැටුම් විෂය හා අතිරේක විෂයන් තාවකාලික ස්ථාන වල පවත්වාගෙන යන බව ඔබතුමා දන්නේද?

(ඇ) i) එම නිසා පාසලේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාම සඳහා වූ ගොඩනැගිලි අවශ්‍යතාවය වෙනුවෙන් ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීමට හැකිද?

ii) නොඑසේ නම් පාසලේ ගොඩනැගිලි අවශ්‍යතාවය වෙනුවෙන් තාවකාලිකව හෝ ස්ථිරව ඉදිරිපත් කල හැකි විසඳුම මොනවාද?

(ඈ) වර්තමානයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන ගොඩනැගිල්ලක් මෙම පාසල අසලම ඇති නමුත් එය වසර 05කට වඩා වැඩි කාලයක් වසා දමා ඇති බව ඔබතුමා දන්නේද?

(ඉ) එකී ගොඩනැගිල්ල අධ්‍යාපන කටයුතු සඳහා මෙම පාසලට ලබා දිය හැකිද?

(ඊ) මෙම ගැටළු විසඳීම සඳහා පියවර ගැනීමට බලාපොරොත්තු වන්නේ කිනම් කාලසීමාවක් තුලද?

9. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/vi(1)/16/62)

(අ) බ/ප/ගම/ මීනුවන්ගොඩ බටේපොල ප්‍රාථමික විද්‍යාලයේ වර්තමානයේ ඉගෙනුම ලබන 350 ක් පමණ වන සිසුන්ට අධ්‍යාපන කටයුතු කිරීමට ප්‍රමාණවත් ගොඩනැගිලි පහසුකම් නොමැති බව ඔබතුමා දන්නේද?

(ආ) මෙම පාසලේ 4B හා 5 ශ්‍රේණි දැනට අබලන් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර 2A, 2B, 3A ශ්‍රේණි තාවකාලික ස්ථාන වල පවත්වාගෙන යන බව ඔබතුමා දන්නේද?

(ඇ) එසේම මෙම පාසැලට පුස්තකාල ගොඩනැගිල්ලක් නොමැති බව ඔබතුමා දන්නේද?

(ඈ) මෙම පාසැලේ ප්‍රාථමික ශ්‍රේණි විෂයන් සඳහා ගුරු හිඟයක් දැනටමත් පවතින බව ඔබතුමා දන්නේද?

(ඉ) i) මෙම ගැටළු සඳහා කඩිනමින් පියවර ගනු ලබන්නේද?

ii) නොඑසේ නම් ඒ මන්ද?

(ඊ) මෙම ගැටළු විසඳීම සඳහා පියවර ගැනීමට බලාපොරොත්තු වන්නේ කිනම් කාලසීමාවක් තුලද?

**10.** ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය, විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/vi(1)/16/63)

(අ) බ/ප/මීගමුව අධ්‍යාපන කොට්ඨාශයේ කොච්චිකඩේ මහා විද්‍යාලයට බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පාසැල් ක්‍රීඩා පිටිය 'සංවර්ධනයට හා ක්‍රීඩාවේ අභිවෘද්ධිය සඳහා කොපමණ මුදලක් වෙන් කරන ලද්දේද?

(ආ) එකී මුදලට වැඩ නිම කිරීමට තෝරා ගත් කොන්ත්‍රාත්කරුගේ නම සඳහන් කරන්නේද?

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් මෙතෙක් නිම කර ඇති වැඩ මොනවාද?

i) එකී වැඩ පරික්ෂා කල තාක්ෂණික නිලධාරියා කවුද?

ii) දැනට නිම කර ඇති වැඩ කොටසේ ප්‍රමිතිය පිළිබඳව සහතික විය හැකිද?

(ඈ) i) මෙම ව්‍යාපෘතිය පිළිබඳ ව පසු විපරමක් ඔබ අමාත්‍යාංශයෙන් කර තිබේද?

ii) සපයන ලද මුදලට ප්‍රමාණවත් සේවාවක් ඉටු කර නැති බව ඔබතුමා පිළිගන්නේද?

(ඉ) i) මෙම ව්‍යාපෘතියේ මුදල් අවභාවිතා වීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල කඩිනමින් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

ii) නොඑසේ නම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. සභාවේ රැස්වීම

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

<u>යෝජනාව</u>

"2016 ජූලි මස 05 වන දින පැවැති පළාත් සභා රැස්වීමේදී එළඹුණු සභා සම්මුතින්ට අනුකූලව අද දින (2016.07.18 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම පළාත් සභාව 2016 අගෝස්තු මස 09 වන දින (අඟහරුවාදා දින) පෙ.ව. 9.30 ට රැස්විය යුතුය."

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01 . ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා:**

'අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නව රජය මගින් පසුගිය රජය විසින් කරන ලදැයි කියන දූෂණ, වංචා, මිනීමැරුම්, රාජ්‍ය දේපල අයුතු ලෙස පරිහරණය කිරීම පිළිබඳව මේ වන විටත්, ඒ සඳහා කමිටු පත් කරමින් වැරදි කරුවන්ට නීතිය මගින් දඬුවම් කිරීම සතුටට කරුණකි.

1989 හා 1990 කාල වකවානුව තුළ තරම් මෙරටේ අති විශාල වශයෙන් රාජ්‍ය දේපල විනාශ කරමින් මිනිස් ඝාතන සිදු වූ කාල පරිච්ඡේදයක් මෑත ලංකා ඉතිහාසයේ නොමැත. එබැවින් මේ පිළිබඳව සොයාබැලීමට කමිටුවක් පත් කර එම රාජ්‍ය දේපල විනාශ කර මිනිස් ඝාතන සිදු කළ පුද්ගලයන්ට නීතිය මගින් දඬුවම් කිරීම හා විනාශ කළ රාජ්‍ය දේපලවල වටිනාකම අදාල වැරදිකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් අතිගරු ජනාධිපතිතුමාගෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව ඉල්ලා සිටියි.'

(යෝ/vi(1)/15/02)

**02. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා;**

'පාසැල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම දැඩි අර්බුදකාරී තත්වයකට පත්ව ඇත.

පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා අනෙකුත් ශ්‍රේණි වලට ළමුන් ඇතුළත් කර ගන්නා ක්‍රමවේදයට සාපේක්ෂව වඩා විධිමත්වූ වැඩ පිළිවෙළක් සකස් වී තිබුණද, එම අනෙකුත් ශ්‍රේණි සඳහා ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා එවන් විධිමත් වැඩපිළිවෙලක් නොමැත. ඒ නිසාම ළමුන් ඇතුළත් කර ගැනීමේදී විවිධ අල්ලස් ගැනීම්, දූෂණ, විවිධ අක්‍රමිකතා සිදු වෙමින් පවතින බව දැනගන්නට ඇත.

එහෙයින්, පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදීදැනට ක්‍රියාත්මක වන්නාක් මෙන්ම අනෙකුත් ශ්‍රේණි වලටද ළමුන් ඇතුළත් කිරීම සඳහා වඩා විධිමත් වූ ක්‍රමවේදයන් සකස් කර බස්නාහිර පළාතේ පාසැල් වලට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අදාල සියළු පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ, පළාත් සභාව අදහස් කරයි.'

(යෝ/vi(1)/15/04)

## XI. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.07.05 දින
සභා ලේකම කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.